| | | | | |
|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 2329270 කොමසාරිස්<br>2326075<br>2329102<br>2348228 | | මගේ අංකය<br>எனது இல.<br>My No. | බප/සමු/තීරක හා නීති1/10 20 |
| ෆැක්ස්<br>பெக்ஸ் இல.<br>Fax | 2329270 | | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| විදුලි පණිවුඩ<br>தந்தி<br>Telegrams | සමුපකොම<br>கூட்டுறவாணை<br>CREDIT | | | |

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
# බස්නාහිර පළාත

තැ.පෙ.444, ආදිපාද වීදිය, කොළඹ 01.

கூட்டுறவுஅபிவிருத்தித் திணைக்களம்
மேல் மாகாணம்,
தபாற் பெட்டி 444,டியூக் வீதி,கொழும்பு 01

DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT
WESTERNPROVINCE
P.O.Box.444, Duke Street,Colombo 01


<u>දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2022</u>

2022.02. 22

ගරු සභාපති,
සියළුම විවිධ සේවා සමුපකාර සමිති ඇතුළු සියළුම මුල්‍ය සේවා සමුපකාර සමිති
බස්නාහිර පළාත.

<u>උසාවි ගත කිරිමට යොමු කර ඇති තීරක ආරවුල් නැවත ලබාගැනීමට අවස්ථාව ලබාදීම.</u>

2011 අංක 04 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58 විධිවිධාන ප්‍රකාරව ආරවුල් බේරුම්කරණය කිරීම සදහා පවතින විධිවිධාන තුල ඔබ සමුපකාර සමිතියට අයත් ණය ආරවුල් තීරකරණය කර උසාවි ගත කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ගොනු විශාල ප්‍රමාණයක් මේ වන විට දිස්ත්‍රික් කාර්යාල වල පවතින බව මා වෙත අනාවරණය වී ඇත. ඒ අනුව උසාවි ගත කිරිම් වේගවත් කිරීම සදහා වෙනම උසාවියක් ඇති කිරිම සදහා යෝජනා සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රේජිස්ත්‍රාර් (රේඛිය) වෙත යෝජනා ඉදිරිපත් කර ඇති නමුත් අදාල තත්ත්වයන් සදහා ඉක්මනින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය අවධානයට ගන්නා ලදී.

02. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රටේ ආර්ථිකය මෙන්ම, ජනතාවගේ ආර්ථික මට්ටම පහල යාම පාලනයකින් තොරව සිදුව ඇති අවස්ථාවක සමුපකාර සමිති වටා එකතුව තම සාමාජීය වරප්‍රසාද ලබාගත් සමුපකාර සාමාජිකයා තමා ලබාගත් ණය මුදල නිසි පරිදි ගෙවීමට නොහැකිව පිඩා විදීමත්, "සමුපකාරය" සාමාජිකයන්ගේ ව්‍යාපාරයක් බැවින් ඔවුන් වෙත සහන සැලසීම කල යුතු වීමත් යන්න සලකා බලමින්, මේ වන විට ඒ සදහා පවතින නෛතික ප්‍රතිපාදන තුල පහත සදහන් පරිදි කටයුතු කිරීමට අවස්ථාව සලසා දෙමි.

03. ඒ අනුව මේ වන විට උසාවි ගත කිරීමට දිස්ත්‍රික් කාර්යාල වලට භාරදී ඇති තීරක තීන්දු විස්තර පහත සදහන් කරුණු වලට යටත්ව නැවත ලබාගෙන ණය ලබාගත් සාමාජිකයා විමසා අදාල ණය මුදල් වටිනාකම් සම්පූර්ණයෙන් අයකර ගැනීමට අවස්ථාව දෙමි.

I. මෙම කාරණය සදහා 2022.03.01 සිට 2022.07.30 දක්වා කාල සිමාව පමණක් ලබාදෙමි.

II. අදාල ණයකරුගෙන් සම්පූර්ණ මුදල අයකර ගැනීමට හැකිනම් තීරක අංකය, නම, තීරක තීන්දුවේ මුදල, තීරක තීන්දුව ලබාදුන් දිනය සහ උසාවි ගත කිරිම සදහා භාර දි ඇති හෝ තීරක තීන්දුව ප්‍රකාරව දින 60 ක කාලය ඉකුත් වන දිනය ඇතුලත්

R

වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයත් සමග තීරක තීන්දු උසාවි බල ගැන්වීම 2022.07.30 දක්වා තාවකාලිකව නතර කරගැනීමට කරනු ලබන ඉල්ලීමක් ලිඛිතව අදාල දිස්ත්‍රික් කාර්යාවලට ලබා දීමට කටයුතු කල යුතුය.

III. සෑම ණය ලබා ගත් සාමාජිකයෙකුගෙන්ම ඇමුණුම 1 හි පරිදි ලේඛනයක් ලබා ගත යුතුය.

IV. අදාල ණයකරු විසින් ණය මුදල් ගෙවීමට එකග වන ආකාරය අනුව මාගේ අංක සමු/මෙ/01/CCD/01 හා 2021.10.10 දිනැති 06/2021 චක්‍රලේඛය උපයෝගි කර ගැනීමට අවසර දෙමි.

V. සාමාජිකයා සමග සාකච්ඡා කර ඉහත පරිදි කටයුතු කිරීමට නොහැකි සියළු තීරක තීන්දු බලගැන්වීම කිරිමට නැවත ඉල්ලීමක් 2022.08.01 දින සිට 2022.08.10 දින යන කාලය තුල දිස්ත්‍රික් කාර්යාල වලට භාරදිය යුතුය .

VI. ඉහත කාලය ආවරණය වන පරිදි මේ වන විට තීරක තීන්දුව ලබා දී එහෙත් තීරක තීන්දුව පරිදි වටිනාකම ගෙවා නොමැති ඔබ සමිතියේ සතුව ඇති තීරක තීන්දු සම්බන්ධයෙන්ද ඉහත පරිදි කටයුතු කිරීමටත් එම කාලයද 2022.07.30 දිනෙන් අවසන් වන පරිදි කටයුතු කිරීමට අවසර දෙමි.

04. ක්‍රියාමාර්ග නොගත් හෝ උසාවි බල ගැන්වීම සදහා නියමිත කාලය තුල නැවත දෙපාර්තමේනතුවට භාර නොදුන් තීරක තීන්දු උසාවි බල ගැන්විම සම්බන්ධයෙන්, ඉදිරි කටයුතු කිරීමට ඉදිරිපත් නොවූ තීරක තීන්දු ලෙස ලේඛන ගත කිරීම සිදුකරන අතර එම ආරවුල සම්බන්ධයෙන් නැවත කටයුතු නොකිරීමට සටහන් කරගන්නා බවත් අවධාරණය කරමි. එබැවින් ලබා දී ඇති කාල සීමාවන් ඉක්මවා නොවන පරිදි කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකිම වේ.

05. මෙම අවස්ථාව උපයෝගි කර ගනිමින් ඔබගේ සමිතියේ ණය ලබාගත් සාමාජිකයාට සහන සැලසෙන අයුරින් ඔබ කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

රුවිනි ඒ විජයවික්‍රම
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්
බස්නාහිර පළාත

<u>පිටපත</u>
සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ / ගම්පහ/ කළුතර)

1. ඉහත සදහන් පරිදි සමුපකාර සමිති විසින්, තීරක තීන්දුව ලබාදී එහෙත් උසාවි ගත කර නොමැති ආරවුල් සම්බන්ධ තීරක තීන්දු උසාවි බලගැන්වීම නොකරන ලෙසට ඉල්ලුම්කරන අවස්ථාවක අදාල අවසරය ලිඛිතව ලබාදීමට කටයුතු කරන්න.

2. තීරක අංශයේ නිලධාරීන් දැනුවත් කර අදාල විස්තර ඉක්මනින් සමිති වෙත ලබාදීමේ වැඩ පිලිවෙලක් සකස් කරමින් නැවත සමිති විසින් ආපසු භාරදෙන ආරවුල් 2022.08.11 සිට උසාවි ගත කිරීමටත් ඉහත 4 යටතේ ණය ආරවුල් ලේඛනය යාවත්කාලින කිරීමටත් කටයුතු කරන්න.
3. මෙම චක්‍ර ලේඛයෙහි සදහන් විධිවිධාන පරිදි කටයුතු කල හැකි අකාරය සම්බන්ධයෙන් සමිතියේ සමිතිභාර නිලධාරි මගින් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කරන්න.

ඇමුණුම 1
( එක් එක් පුද්ගලයා වෙනුවෙන් පිරවිය යුතුය.)

## තීරක තීන්දු සම්බන්ධයෙන් නැවත සලකා බැලීම

2011 අංක 04 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58 විධිවිධාන ප්‍රකාරව ආරවුල් බේරුම්කරනය කිරිම සදහා පවතින විධිවිධාන තුල සමුපකාර සමිතියට අයත් ණය ආරවුල් තීරකරණයට යොමුකර මේවන විට උසාවි ගත කිරිම සදහා භාරදී ඇති පහත ආරවුල සම්බන්ධයෙනි.

සමිතිය -........................................................

තීරක ආරවුල් අංකය -....................................................

ණයකරුගේ නම -...................................................

තීරක තීන්දුව අනුව ණය මුදල -....................................................

ණයකරු කැදවා ලබාගත් තීරණය -....................................................

ණයකරුගේ එකඟතාවය හා අත්සන -....................................................

අධ්‍යක්ෂ මණ්ඩල එකගතාව ලබාගත් දිනය -..............................

ඉහත සදහන් කරුණු නිවැරදි බවත් , මෙම ආරවුල උසාවි ගත කිරීම අවශ්‍ය නොවන බවත් මෙයින් සහතික කරමි.

ලේකම්ගේ නම -....................................................

අත්සන -............................

දිනය -............................